# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2455/05 - 2025 සැප්තැම්බර් මස 22 වැනි සඳුදා - 2025.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :-*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අටුළුගම් කෝරළයේ නැගෙනහිර සුළු කොට්ඨාසයේ, අංක 114 දැරණියගල උතුර ග්‍රාම නිලධාරි වසමේ, දැරණියගල ගමේ පිහිටි, කැ.සි. 610559 කලාප 1 පත්‍ර අංක 1 හා 2024.10.29 දිනැති පිඹුරේ, පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි 1 සිට 4 (කැබලි 4) ට මායිම්:

**01. කැබලි අංක 01**

ඉඩමේ නම: මාලිගාතැන්න වත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, අවු. 20-30 ක් පමණ වයසැති මිශ්‍ර වගාවක්, ජල ටැංකියක්, අත්තිවාරමක් සහ ස්ථිර කොඩනැගිල්ලක කොටසක්; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.3863 (අක් 0 රූඩ් 3 පර්චස් 32.7).

*මායිම්* :

*උතුරට* : අ.ග.පි. 621 හි කැබලි අංක 1638; *නැගෙනහිරට* : අ.ග.පි. 621 හි කැබලි අංක 1638 සහ මෙම පිඹුරේ කැබලි අංක 2; *දකුණට* : කැබලි අංක 2 සහ අ.ග.පි. 621 හි කැබලි අංක 1636; *බටහිරට* : අ.ග.පි. 621 හි කැබලි අංක 1636 සහ 1638.

**02. කැබලි අංක 02**

ඉඩමේ නම: මාලිගාතැන්න වත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, අවු. 20-30 ක් පමණ වයසැති මිශ්‍ර වගාවක්, ස්ථිර කොඩනැගිල්ලක් සහ ස්ථිර ගොඩනැගිලි 3 ක කොටස් ඇත; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.4640 (අක් 1 රූඩ් 0 පර්චස් 23.5).

*මායිම්* :

*උතුරට* : අ.ග.පි. 621 හි කැබලි අංක 1638, මෙම පිඹුරේ කැබලි අංක 1 සහ අ.ග.පි. 621 හි කැබලි අංක 1638; *නැගෙනහිරට* : අ.ග.පි. 621 හි කැබලි අංක 1638, 1215 සහ මෙම පිඹුරේ කැබලි අංක 3; *දකුණට* : කැබලි අංක 3 සහ 4; *බටහිරට* : මෙම පිඹුරේ කැබලි අංක 4, අ.ග.පි. 621 හි කැබලි අංක 1637 සහ 1636 සහ මෙම පිඹුරේ කැබලි අංක 1.

**03. කැබලි අංක 03**

ඉඩමේ නම: මාලිගාතැන්න වත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0804 (අක් 0 රූඩ් 0 පර්චස් 31.8).

*මායිම්* :

*උතුරට* : කැබලි අංක 2 සහ අ.ග.පි. 621 හි කැබලි අංක 1215; *නැගෙනහිරට* : අ.ග.පි. 621 හි කැබලි අංක 1215 සහ 1208; *දකුණට* : අ.ග.පි. 621 හි කැබලි අංක 1208 සහ 1209; *බටහිරට* : අ.ග.පි. 621 හි කැබලි අංක 1209 සහ මෙම පිඹුරේ කැබලි අංක 4 සහ 2.


1A - G 045425 - 29 (2025/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කැබලි අංක 04**

ඉඩමේ නම: මාලිගාතැන්න වත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: වත්ත, අවු. 20-30 ක් පමණ වයසැති මිශ්‍ර වගාවක්; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0110 (අක් 0 රූඩ් 0 පර්චස් 4.3).

*මායිම්* :

*උතුරට* :—; *නැගෙනහිරට* :—; *දකුණට* :—; *බටහිරට* :—.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 නොවැම්බර් මස 17 වැනි දින පෙ. ව. 10.00 ට දැරණියගල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 නොවැම්බර් මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**පී. සී. මධුෂානි ද සිල්වා,**
ප්‍රාදේශීය ලේකම්,
දැරණියගල.

2025 සැප්තැම්බර් මස 16 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0207

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KDS/DOL/4/4/5/4/1.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 13/97/A/196.

උක්ත ශීර්ෂය යටතේ 2001.02.14 දිනැතිව අංක 1171/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ දැන්වීම අනුව මු.පි.මහ. 4883 දරන පිඹුරේ කැබලි අංක 63 දරන ඉඩමේ ප්‍රමාණය හෙක්. 0.0630 වෙනුවට හෙක්. 0.0634 ලෙස සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඩබ්. ජී. යමුනා දයාරත්න,**
ප්‍රාදේශීය ලේකම්/
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
දොළුව.

2023 සැප්තැම්බර් මස 10 වැනි දින,
දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0208

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.